# 2022 වර්ෂයේ දී සිසු ඉගෙනුම් අවස්ථා අහිමිවීම ආවරණය සඳහා වන විශේෂ විෂය නිර්දේශය

## 6 ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

විද්‍යා හා තාක්ෂණ පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

www.nie.lk

# හැඳින්වීම

රට තුළ පැන නැගී තිබූ උග්‍ර ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතා සහ වෙනත් විවිධ හේතූන් මූලික කර ගනිමින් 2022 වර්ෂය ආරම්භයේ සිට ම වරින් වර පාසල් වසා තැබීම සිදු විය. පාසල් වසා තබන ලද කාල සීමාව තුළ දී ඉගෙනීමේ ක්‍රමය මාර්ගගත ක්‍රමය වෙත මාරු වුව ද මේ සඳහා පහසුකම් සපයා ගත හැකි දරු පිරිස ඉතා සීමිත සංඛ්‍යාවකි. ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපනය ලබා දීමේ ප්‍රවේශය සහ ගුණාත්මකභාවය අතින් බොහෝ අඩුපාඩු පෙන්නුම් කර ඇති අතර මෙම ක්‍රමය හේතුවෙන් ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය ශක්තිමත් වී ඇති අතර සිසුන්ගේ පාසල් කාලය අහිමි වීම තුළ පාසල් ප්‍රජාවගෙන් සිසුන් ඈත්වීම ද යහපත් ප්‍රවනතාවක් නොවන බව දැකිය හැකි ය.

පවතින අභියෝගතා මධ්‍යයේ වුව ද යම්තාක් දුරකට හෝ විධිමත් ලෙස පාසල් පැවැත්වීම අනාගත් දරු පරපුරේ අභිවෘද්ධියට හේතු සාධක වනු ඇත. එම අරමුණින් යුතුව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත් මට්ටමින් රැස් කර ගෙන ඇති තොරතුරු මත සමස්ථයක් ලෙස පළමු වාරයට අදාළ ව පාසල් පවත් වන ලද දින ගණන දින 30ක් ලෙස පෙන්වා දී ඇත.

මෙම තීරණයට අනුව හය ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පළමුවන වාරයේ ඉතිරිව ඇති පාඩම් ආවරණය කිරීම සඳහා කාලච්ඡේද 4 ක් ද දෙවන හා තුන්වන වාරයේ පාඩම් ආවරණය කිරීම සඳහා කාලච්ඡේද 7ක් බැගින් ද යොජනා කර ඇත. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ නිළධාරින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිළධාරින්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිළධාරින් සහ පළාත් සම්බන්ධීකරණ නිළධාරින්ගේ සහභාගීත්වයෙන් යුතු ව මෙම 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා වන ප්‍රතිසාධන සැලැස්ම සකස් කර ඇත.

දැනට පවතින හය ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂය නිර්දේශය සැලකීමේ දී පළමුවන වාරය සඳහා පාඩම් තුනක් ඇතුළත් කර ඇති අතර ඒ සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 4කි. දෙවන වාරය සඳහා පාඩම් දෙකක් ඇතුළත් කර ඇති අතර එම පාඩම් ආවරණය සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 7කි. තුන්වන වාරයට පාඩම් දෙකක් ඇතුළත් කර ඇති අතර එම පාඩම් ආවරණය සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 7කි.

**පළමුවන වාරය සඳහා කාලච්ඡේද 4ක් සහ දෙවන හා තුන්වන වාර සඳහා කාලච්ඡේද 7ක් බැගින් සමානව යෝජනා කර ඇති නිසා මූලික වශයෙන් දැනට පවතින විෂය නිර්දේශයේ පහත සංශෝධන සිදු කරමින් අත්‍යාවශ්‍ය යැයි සළකන විෂය අන්තර්ගතය ඇතුළත් කරමින් මෙම ප්‍රතිසාධන සැලැස්ම සකස් කර ඇත.**

- පළමුවන වාරයේ 1.0 නිපුණතාවය සහ 2.0 නිපුණතා මට්ටමේ සිට 2.1 නිපුණතා මට්ටම දක්වා පාසල පවත්වන ලද දින 21 තුළ දී නියමිත පරිදි ආවරණය කර ඇති සේ සළකා පළමුවන වාරයේ ඉතිරි ව ඇති නිපුනතා මට්ටම 2.2 සහ 3.0 නිපුණතාවය යෝජිත කාලච්ඡේද 4ක් තුළ අවසන් කිරීමට යෝජනා කර ඇත.

- තුන්වන වාරයට නියමිතව තිබූ නිපුණතා මට්ටම් 5.1 සිට 5.2 දක්වා දෙවන වාරය තුල දී ඉගැන්වීමට යොමු කර ඇත

මීට අමතර ව ඉගැන්වීමට යෝජනා කර ඇති සියලු ම පාඩම් හි සංකල්ප සාකච්ඡා කිරීම, එක් එක් වාරයට යෝජනා කර ඇති කාලච්ඡේද ගණන තුළ ආවරණය කිරීමට යෝජනා කර ඇත. එක් එක් පාඩමට අදාළ ව කාලච්ඡේද වෙන් කර ගත යුතු ආකාරය පළමුවන, දෙවන හා තුන්වන වාරවලට අදාළ ව වෙන් වෙන් වශයෙන් විෂය නිර්දේශය යටතේ ඉදිරිපත් කර ඇත. වෙන් කර ඇති කාලච්ඡේද ගණන පාසලේ සිසුන්ගේ ස්වභාවය මත හා එක් එක් වාරයට යෝජනා කර ඇති කාලච්ඡේද ගණනට යටත්ව සංශෝධනය කර ගැනීමට මෙන් ම යෝජිත කාලච්ඡේද ගණන අවසන් වීමට ප්‍රථම පළමුවන හා දෙවන වාරයට යෝජනා කර ඇති පාඩම් ඉගැන්වීම අවසන් කරයි නම් **අත්‍යාවශ්‍ය නොවේ යැයි සළකා ඉවත් කර ඇති පාඩම්, සිසු ස්වයං අධ්‍යයනයට යොමු කිරීමට** ද දෙවන හා තුන්වන වාරයට අදාළ පාඩම් පිළිවෙලින් ඉගැන්වීම ආරම්භ කිරීමට ද ගුරුවරයාට නිදහස ඇත.

## ගුරුවරුන් සඳහා උපදෙස්:

- 06 ශ්‍රේණියේ සිසුන්ට සම්පූර්ණ කිරීම සඳහා අත්‍යවශ්‍ය වන විෂය අන්තර්ගතය පහත වගුවේ **දක්වා** ඇත
- ගුරුවරයාට තම අභිමතය පරිදි ඕනෑම අත්‍යවශ්‍ය අන්තර්ගතයක් ඇතුළත් කිරීමට නිදහස ඇත
- ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලියේදී මිශ්‍ර ඉගෙනුම් ක්‍රමය අනුගමනය කරන ලෙස ගුරුවරුන්ට උපදෙස් දෙනු ලැබේ
- 'ගුරුගෙදර' සහ 'ඉ -තක්සලාව' යන ඉගෙනුම් එළඹුම් භාවිතයෙන් තම විෂය දැනුම දියුණුකර ගැනීමට සිසුන් මෙහෙයවන්න.
- 'ගුරුගෙදර' සහ 'ඉ -තක්සලාව' භාවිත කිරීමට අපහසුතා පවතින සිසුන් සඳහා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් සපයන්න.

රටේ වත්මන් තත්ත්වය තුළ ඉගෙනීම අහිමි වන කාලය හේතුවෙන් අත්‍යවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අන්තර්ගතයන් ආවරණය වන පරිදි මෙම ලේඛනය නිර්මාණය කර ඇත

## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)

### 6 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | අන්තර්ගතය | ගුරුමාර්ගෝපදේශ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලය / කාල ච්ඡේද |
|---|---|---|---|---|---|---|
| 6 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 2. පරිගණක ආරක්ෂිතව භාවිතා කිරීමේ අවශ්‍යතාවය අගය කරයි | 2.2 පරිගණක සහ පර්යන්ත උපාංග සුපරික්ෂාකාරීව භාවිත කරයි | • පරිගණකය ඇරඹුම්/ නිමාව සඳහා නිවැරදි පියවර අනුගමනය කරයි<br>• ආචාරධර්මවලටඅනුකූලව පරිගණක භාවිත කරයි<br>• කල් ඉකුත්ව ඇති පරිගණක / පර්යන්ත උපාංග ආරක්ෂිතව බැහැර කරයි<br>• ආරක්ෂිතව පරිගණක පරිහරණය අවබෝධ කර ගෙන භාවිත කරයි | • පරිගණකයේ ආරම්භයට/ නිමාවට අදාල නිවැරදි පියවර<br>• පරිගණක සහ පර්යන්ත උපාංග සුපරික්ෂාකාරීව භාවිත කරයි<br>• පරිගණකය භාවිතා කිරීමේ ආචාරධර්ම<br>• සෞඛ්‍ය ගැටළු අවම කිරීම සඳහා නිවැරදි ඉරියව්<br>• ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය<br>○ අනවසරයෙන් ප්‍රවේශ වීම වැළැක්වීම සඳහා මුරපද භාවිත කිරීම | පිටු අංක 26 හි ඇති ඒකකය 2.2 බලන්න | පිටු අංක 17 සිට 25 තෙක් ඇති පාඩම් බලන්න | 01 |
| 3. මෙහෙයුම් පද්ධති භාවිත කරයි | 3.1 ගොනු හසුරුවයි | • ගොනුවක් නිමවා සුරකියි<br>• ගොනුවක් විවෘත කර සංස්කරණය කරයි<br>• කවුළුවක් අවම කිරීම /උපරිම කිරීම / ප්‍රතිප්‍රමාණ කිරීම | • සරල චිත්‍රක මෘදුකාංග උපයෝගීකර ගැනීමින් ගොනු හැසිරවීම කරයි. ඒ මගින්<br>○ නිර්මාණය<br>○ සුරැකීම<br>○ විවෘත කිරීම<br>○ සංස්කරණය<br>○ වසා දැමීම | පිටු අංක 29 හි ඇති ඒකකය 3.1 බලන්න | පිටු අංක 27 සිට 39 තෙක් ඇති පාඩම් බලන්න | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | අන්තර්ගතය | ගුරුමාර්ගෝපදේශ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලය / කාල විච්ඡේද |
|---|---|---|---|---|---|---|
| | | | • කවුළුවක් අවම කිරීම /උපරිම කිරීම / ප්‍රතිප්‍රමාණ කිරීම | | | |
| 4. යෙදුම් මෘදුකාංග උචිත ලෙස භාවිත කරයි | 4.1 පාඨ සංස්කරණය සහ චිත්‍රක මෘදුකාංග ඵලදායීව භාවිත කරයි | • මූසිකය සහ යතුරු පුවරුව ඵලදායී ලෙස භාවිතා කරයි | • මූසිකය නිසිලෙස හැසිරවීම සඳහා චිත්‍රක මෘදුකාංග උපයෝගී කර ගැනීම | පිටු අංක 35 හි ඇති ඒකකය 4.1 බලන්න | පිටු අංක 41 සිට 46 තෙක් ඇති පාඩම් බලන්න | 01 |
| **මුලු කාලච්ඡේද ගණන** | | | | | | **04** |

# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)

## 6 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | අන්තර්ගතය | ගුරුමාර්ගොපදේශ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලය / කාල ච්ඡේද |
|---|---|---|---|---|---|---|
| 6 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 4. යෙදුම් මෘදුකාංග උචිත ලෙස භාවිත කරයි | 4.1 පාඨ සංස්කරණය සහ චිත්‍රක මෘදුකාංග ඵලදායීව භාවිත කරයි<br><br>4.2 ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සංස්කරණ මෘදුකාංග ඵලදායීව භාවිත කරයි | ● නිවැරදි ඇඟිලි වලන භාවිත කරමින් යතුරු ලියනය කරයි<br><br>● ශ්‍රව්‍ය ගොනුවක් නිර්මාණය කරයි<br>● දෘශ්‍ය ගොනුවක් නිර්මාණය කරයි | ● යතුරුපුවරු හැසිරවීමේ කුසලතාව ප්‍රවර්ධනය කිරීම සඳහා යතුරුලියන මෘදුකාංග උපයෝගී කර ගැනීම<br><br>● ශ්‍රව්‍ය පසුරක්(Audio clip) නිර්මාණය කිරීමට ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග භාවිත කිරීම<br>● දෘශ්‍ය පසුරක්(Video clip) නිර්මාණය කිරීමට දෘශ්‍ය සංස්කරණ මෘදුකාංග භාවිත කිරීම | පිටු අංක 35 හි ඇති ඒකකය 4.1 බලන්න<br><br>පිටු අංක 45 හි ඇති ඒකකය 4.2 බලන්න | පිටු අංක 47 සිට 51 තෙක් ඇති පාඩම් බලන්න | 05 |
| 5. ඇල්ගොරිතම සංකල්පය අගය කර සරල ක්‍රමලේඛ සංවර්ධනය කරයි | 5.1 ඇල්ගොරිතමයකට අදාල වන ප්‍රායෝගික ගැටළු විසඳීමේ ක්‍රියාවලිය විස්තර කරයි<br><br>5.2 ක්‍රියාවලියක් පැහැදිලි කිරීම සඳහා ගැලීම් සටහන් අඳියි | ● පියවර අනුක්‍රමයක් ලෙස ගැටළු විසඳීමේ ක්‍රමවේදය හඳුනා ගනියි<br>● ගැලීම් සටහන් සංකේත හඳුනා ගනියි | ● වට්ටෝරුවකට අනුව අන්තර්ගතයන් සැකසීම<br>● (උදා. කේක් එකක් සෑදීම)<br>● ගැලීම් සටහන් සංකේත හැඳින්වීම<br>○ ආරම්භය/නිමාව<br>○ ආදාන/ප්‍රතිදාන<br>○ ක්‍රියාවලිය | පිටු අංක 52 හි ඇති ඒකකය 5.1 බලන්න<br><br>පිටු අංක 54 හි ඇති ඒකකය 5.2 බලන්න | පිටු අංක 52 සිට 56 තෙක් ඇති පාඩම් බලන්න | 02 |
| මුලු කාලච්ඡේද ගණන | | | | | | 7 |

# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss – 2022)

## 6 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | අන්තර්ගතය | ගුරුමාර්ගොපදේශ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලය / කාල චේඡේද |
|---|---|---|---|---|---|---|
| 6 ශ්‍රේණිය නෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 5. පරිගණක ආරක්ෂිතව භාවිතා කිරීමේ අවශ්‍යතාවය අගය කරයි | 5.2 ක්‍රියාවලියක් පැහැදිලි කිරීම සඳහා ගැලීම් සටහන් අදියි | • ගැලීම් සටහනකින් ක්‍රියාවලි ඉදිරිපත් කරයි | • ගැලීම් සටහන් යොදා ගනිමින් එදිනෙදා කාර්යයන්ගේ ක්‍රියාවලීන් නිරූපණය කිරීම | පිටු අංක 54 හි ඇති ඒකකය 5.2 බලන්න | පිටු අංක 58 සිට 62 තෙක් ඇති පාඩම් බලන්න | 03 |
| 6. තොරතුරු රැස් කිරීම සහ සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිතය අගය කරයි | 6.1 තොරතුරු මූලාශ්‍රය හවුලේ භාවිත කළ හැකි සංචිතයක් ලෙස අන්තර්ජාලය හඳුනා ගනියි | • අන්තර්ජාලය අර්ථ දක්වයි<br>• අන්තර්ජාලයට ප්‍රවේශ වෙයි | • අන්තර්ජාලය හැඳින්වීම අතිරික්සු කිරීම පුහුණුව සඳහා අධ්‍යාපනික වෙබ් අඩවි කරා ප්‍රවේශ වීම | පිටු අංක 57 හි ඇති ඒකකය 6.1 බලන්න | පිටු අංක 64 සිට 68 තෙක් ඇති පාඩම් බලන්න | 02 |
| | 6.2 තොරතුරු ලබා ගැනීම සඳහා සෙවුම් යන්ත්‍ර භාවිත කරයි | • සෙවුම් යන්ත්‍ර පරිශීලනය කර තොරතුරු ලබා ගනියි<br>• සුරක්ෂිත සහ ආරක්ෂිත ක්‍රියා | • සෙවුම් යන්ත්‍ර හැඳින්වීම<br>• විශේෂ මාතෘකා ඔස්සේ තොරතුරු සෙවීම සඳහා සෙයුම් යන්ත්‍ර උපයෝගී කර ගැනීම | පිටු අංක 64 හි ඇති ඒකකය 6.2 බලන්න | පිටු අංක 65 සිට 74 තෙක් ඇති පාඩම් බලන්න | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | අන්තර්ගතය | ගුරුමාර්ගොපදේශ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලය / කාල ච්ඡේද |
|---|---|---|---|---|---|---|
| | 6.3 පරිගණක දත්ත ආරක්ෂිතව සහ සුරක්ෂිතව භාවිත කරයි | පටිපාටි අනුගමනය කරයි | • වේශ පාලනය කිරීමේ යාන්ත්‍රණික යෙදුම් (පරිශීලක නාමය, මුරපද,.. ආදිය) | පිටු අංක 68 හි ඇති ඒකකය 6.2 බලන්න | පිටු අංක 75 සිට 79 තෙක් ඇති පාඩම් බලන්න | 01 |
| මුලු කාලච්ඡේද ගණන | | | | | | **07** |